**08-10-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ මෙම පාසැලට පැමිණ සිටින්නේ දිව්‍යලෝකය සඳහා ගමන් බලපත්‍රයක් ලබා ගැනීමටයි. ජීවාත්ම අවධානයට පත්වී ඔබගේ නම වාර්තා පොතේ සටහන් කර ගැනීමෙන් ඔබ දිව්‍යලෝකයට යයි.

**ප්‍රශ්නය:** කුමන අවධානය නොතිබීමෙන්ද සමහර දරුවන් පරම පියාට ගෞරව නොකරන්නේ?

**පිළිතුර:** සමහර දරුවන්ට, මුළු ලොවම අඬගසන ඒකායන කෙනා, සැවොම මෙනෙහි කරන ඒකායන කෙනා, උසස්ම උසස් ඒකායන පරම පියායි අප ඉදිරියේ සිට අපට සේවය කරන්නේ යන අවධානය නොමැත. මෙම විශ්වාසය ඇත්තේ අංක අනුපිළිවෙළට අනුවයි. ඔබ තුළ විශ්වාසය ඇති තරමට අනුව එම ගෞරවය තිබෙයි.

**ගීතය:** ඥාන වැසි වසින්නේ ආදරවන්තයා සමඟ සිටිනා අයටයි.

ඕම් ශාන්ති. දරුවන් සැම දෙනාම ඥාන සාගරය සමඟ සිටියි. සැම දරුවෙකුටම එක ස්ථානයක සිටිය නොහැක. ඔහුත් සමඟ සිටින්නන්ට ඥානයට කෙලින්ම සවන් දිය හැකි වන අතර, ඈත ජීවත් වන අයට එය ලැබෙන්නේ ටිකක් ප්‍රමාද වීය. කෙසේවෙතත්, පරම පියාත් සමඟ සිටින අය, ඈත ජීවත් වන අයට වඩා වේගයෙන් දියුණු වනවා යැයි කිව නොහැක. නැත, ඈත ජීවත් වන අය වැඩියෙන් ඉගෙන ගෙන වැඩියෙන් දියුණු වන බව ප්‍රායෝගිකව දැක තිබේ. අසීමිත පියා අනිවාර්යෙන්ම මෙහි සිටියි. ඔය බ්‍රහ්මීණ් දරුවන් අංකානුසාරයි. ඔය දරුවන් දිව්‍යමය ගුණ ධර්ම ධාරණය කර ගත යුතුයි. සමහර දරුවන් විශාල අත්වැරදීම්ද සිදු කරයි. මුළු ලොවම මෙනෙහි කරන අසීමිත පියා අපට සේවය කිරීමේ නිරත වී, උසස්ම අය වීමට අපට මාර්ගය පෙන්වමින්, බොහෝ සෙනෙහසින් අපට විස්තර කර දෙන බව, ඔවුන්ට වැටහෙන මුත්, ඔවුන් ඔහුට එතරම් ගෞරවයක් දක්වන්නේ නැත. බන්ධන තුළ සිටින අය බොහෝ ගුටි කෑම් වලට ලක් වෙයි. ඔවුන් අසරණයි, එහෙත් ඔවුන් සිහිපත් කිරීමේ හිඳ, හොඳින් ඥානය ගනී. ඔවුන්ගේ තත්ත්වය උසස් වෙයි. බාබා මෙය සැම දෙනා ගැනම නොකියයි. එය ඔබ උත්සාහ ගන්නා තරමට අනුව අංකානුසාරයි. පරම පියා ඔය දරුවන්ට අනතුරු අඟවයි. සැමටම එක සේ විය නොහැක. පිටත ජීවත් වන, බන්ධන තුළ සිටිනා අය තවමත් හොඳ ආදායමක් උපයා ගනී. මෙම ගීතය භක්ති මාර්ගයේ අය විසින් රචිත එකකි. කෙසේවෙතත්, ඔබ වෙනුවෙන් එහි සාරය උකහා ගැනීම වටිනවා. ආදරවන්තයා කවුරුන්ද, කාගේ ආදරවන්තයා ද, මේ පිළිබඳව ඔවුන් දන්නේ මොනවාද? ජීවාත්මයන් තමන්ව වත් නොදන්නා බැවින්, ඔවුන් පරම පියාව හඳුනන්නේ කෙසේද? ඔහුද ජීවයක්ය, එසේ නොවේද? මා කවුරුන්ද, පැමිණියේ කොහේ සිටද කියාවත් ඔවුන් දන්නේ නැත. සැම කෙනෙක්ම ඉන්නේ ශරීර අවධානයෙන්ය. කිසි කෙනෙක් ජීවාත්ම අවධානයේ නොමැත. ඔවුන් ජීවාත්ම අවධානයට පත් වූයේ නම් එවිට ජීවාත්මයන් ඔවුන්ගේ පියා හඳුනා ගනී. ශරීර අවධානයෙන් සිටින නිසා ඔවුන් ජීවාත්මයවත් පරම පියා, පරමාත්ම ජීවයවත් නොහඳුනති. පරම පියා මෙතැන අසුන් ගෙන ඔය දරුවන්ට පෞද්ගලිකවම විස්තර කර දෙයි. මෙය අසීමිත පාසැලකි. දෙව්ලොව අධිකාරිත්වය ලබා ගැනීමේ එකම අරමුණ සහ ඉලක්කය තිබේ. දෙව්ලොව විවිධ මට්ටම් වල තරාතිරම් තිබේ. රජු සහ රාජිණිය මෙන්ම වැසියන්ද සිටියි. පරම පියා පවසන්නේ මම නැවත වරක් පැමිණ සිටින්නේ ඔබව ද්විත්ව ඔටුනු පළන් අය බවට පත් කරවීමටයි. හොඳින් ඉගෙන ගන්නා අයට මෙය විය හැකි බව ඔවුන්ගේ ඇතුලාන්තයට වැටහෙයි. ඔවුන් සම්පූර්ණයෙන්ම කැප වී ඇති අතර විශ්වාසයද තිබේ. ඔබ අපවිත්‍ර ක්‍රියා නොකළ යුතු බව ඔබ සැමටම වැටහෙයි. සමහරුන්ට බොහෝ දුර්වලතා තිබේ. එතරම් උසස් තරාතිරමක් හිමි වීමට යන්නේ තමන්ට බව ඔවුන් නොසළකයි. මේ නිසයි ඔවුන් උත්සාහ නොගන්නේ. ඔබට එය වීමට හැකි දැයි පරම පියාගෙන් විමසුවේ නම්, ඔහුට විගසින් එය කිව හැක. ඔබ තමන් දෙස බලන්නේ නම්, එතරම් උසස් තරාතිරමක් ඔබට හිමි කර ගත නොහැකි බව ඔබට වැටහෙයි. එයට සුදුසුකම් ද අවශ්‍ය වෙයි. ස්වර්ණමය සහ රිදීමය යුගයන්හිදී එවැනි දේවල් නොපවතී. එහි ඇත්තේ ත්‍යාගයයි. එකළ පැමිණෙන රජවරුන්ට තම වැසියන් කෙරෙහි බෙහෙවින් සෙනෙහසක් ඇත. ඔවුන් මවක හා පියෙකු මෙනි. මේ, අසීමිත පියා බව ඔය දරුවන් දනී. මුළු ලොවම ලියාපදිංචි කරන කෙනා ඔහුයි. ඔබද තමන්ව ලියාපදිංචි කර ගන්නවා, එසේ නොවේද? ඔහු ඔබට ගමන් බලපත්‍රයක් ලබා දෙයි. දෙව්ලොවට අධිපතියන් වීම සඳහා ඔබ ගමන් බලපත්‍රයක් මෙහිදී ලබා ගනී. දෙව්ලොව යෑමට තරම් සුදුසුකමක් ඇති සැම කෙනෙක්ම තම ඡායාරූපයක් ගත යුතු බව බාබා පවසයි මන්ද,

ඔබ සාමාන්‍ය මනුෂ්‍යයින්ගෙන් දේවතාවරුන් බවට පරිවර්ථනය වන නිසාය. එය අසලින් ඔබ ඔටුන්නක් පැළඳ, සිංහාසනයක් මත වාඩි වී සිටිනා ඡායාරූපයක් තැබිය යුතුයි. එය බවටයි ඔබ පත්වෙමින් සිටින්නේ. ඔබ මෙම සාම්පලය ප්‍රදර්ශන වල තැබිය යුතුයි. මෙය රාජ යෝගාවයි. නිදසුනක් වශයෙන් කෙනෙක් නීතිඥයෙක් වීමට පුහුණුව ලබද්දී, එක පැත්තකින් ඔහු සාමාන්‍ය ඇඳුමින් සැරසුණු ඡායාරූපයක්ද අනෙක් පස, ඔහු නීතිඥ ඇඳුමින් සැරසී ගත් ඡායාරූපයක්ද තබයි. ඒ අන්දමින්ම, එක් පසෙකින් ඔබ සාමාන්‍ය ඇඳුමින් සැරසී ගත් ඡායාරූපයක්ද අනෙක් පස ඔබ ද්විත්ව ඔටුනු පැළඳගෙන ගත් ඡායාරූපයක් ද තිබිය යුතුයි. මෙසේ අසන පිංතූරයක් තැබිය හැක ඔබට කුමක් වීමටද උවමනා? ඔබට නීතිඥයෙක් ආදිය වීමට උවමනා ද, නැත්නම් රජවරුන්ගෙත් රජකෙනෙක් වීමටද? ඔබ ළඟ එවැනි පිංතූර තිබිය යුතුයි. නීතිඥයින්, විනිශ්වයකාරවරුන් ආදිය සිටින්නේ මෙහිය. ඔබ නව ලොවෙහි රජවරුන්ගේත් රජෙක් වීමට යයි. ඔබගේ අරමුණ සහ ඉලක්කය ඔබ ඉදිරියේ ඇත. ඔබ මෙය බවටයි පත්වන්නේ. පැහැදිලි කිරීම ඉතාමත් හොඳයි! පිංතූර විශාල ප්‍රමාණයෙන් ඉතා හොඳ ඒවා විය යුතුයි. ශිෂ්‍යයින් නීතිඥයෙකු වීමට ඉගෙන ගන්නා විට, නීතිඥයෙකු සමඟ යෝගා වී නීතිඥයෙකු බවට පත්වෙයි. මෙම කෙනාගේ යෝගාව ඇත්තේ පරම පියා, පරමාත්ම ජීවය සමඟයි. එබැවින් ඔහු ද්විත්ව ඔටුනු පළන් අයෙකු වෙයි. පරම පියා විස්තර කරයි ඔය දරුවන් දැන් මේ මත ක්‍රියා කළ යුතුයි. ලක්ෂමි සහ නාරායන් ගේ පිංතූරය විස්තර කිරීම ඉතා පහසුයි. ඔබ මෙය බවටයි පත්වෙන්නේ. එබැවින් ඔබට අනිවාර්යෙන්ම අළුත් ලොවක් අවශ්‍ය වන්නේය. අපායට පසුව දිව්‍ය ලෝකය ඇති වෙයි. මෙය දැන් වඩාත්ම ශ්‍රේෂ්ඨ වූ සංගම් යුගයයි. මෙම ඉගෙනුම ඔබව බොහෝ සේ උසස් කරවයි. මෙහි මුදල් ආදියෙහි අවශ්‍යතාවයක් නැත. ඔබ ඉගෙන ගැනීමට උනන්දුවක් දැක්විය යුතුයි. ඉගෙන ගැනීමට ඇති තරම් මුදල් නොතිබුණු බොහෝ සේ දුප්පත් කෙනෙක් කළෙක සිටියේය. එනමුත් ඔහු උත්සාහ දරා, ධනවත් වී, වික්ටෝරියා රැජිනගේ අමාත්‍යවරයා විය. ඔබද මෙකළ බොහෝ දුප්පත්ය. පරම පියා ඔබට බොහෝ උසස් දේවල් උගන්වයි. මෙහිදී ඔබට ඇත්තේ ඔබගේ බුද්ධියෙන් පරම පියාව සිහිපත් කිරීම පමණයි. ලයිට් දැමීම ආදිය අවශ්‍ය වන්නේ නැත. ඔබට ඕනෑම තැනක අසුන් ගෙන ඔහුව සිහිපත් කළ හැක. කෙසේවෙතත්, මායා කෙසේද යත් ඇය ඔබට පරම පියාව අමතක කිරීමට පොළඹවයි. සිහිපත් කිරීමේ පමණයි බාධක ඇත්තේ. මෙය සටනකි. ජීවාත්මයන්, පරම පියා සිහිපත් කිරීමෙන් පාරිශුද්ධත්වයට පත්වෙයි. ඔබ ඉගෙන ගන්නා විට මායා කිසිවක් නොකරයි. සිහිපත් කිරීමේදි කුල්මත්භාවය, ඉගෙනුමේදීට වඩා වැඩියි. මේ නිසයි ඉපැරණි යෝගාව සිහිපත් කර ඇත්තේ. යෝගාව සහ ඥානය යැයි කියැවේ. යෝගා කිරීම සඳහා ඔබට ඥානය ලැබෙයි. සිහිපත් කිරීමේ ක්‍රම ඔබට කියා දෙනු ලැබේ. ලෝක චක්‍රය පිළිබඳ ඥානය ද තිබේ. වෙනින් කිසිවෙකු නිර්මාණකරු හෝ නිර්මාණයේ මුල, මැද සහ අවසානය නොදනී. ඔවුන් භාරතයේ ඉපැරණි යෝගාව උගන්වයි. ඉපැරණි යනුවෙන් හැඳින්වෙන්නේ නව ලොවටයි. ඔවුන් පවසන්නේ එය වසර සිය දහස් ගණනක් පැරණි කියායි. චක්‍රයේද බොහෝ විවිධ කාල සීමාවන් ඔවුන් පෙන්වයි. සමහරු එක් දෙයක් කියන අතර තව සමහරු තව දෙයක් කියයි. මෙහි, ඔබට උගන්වන්නේ එකම පරම පියා පමණයි. ඔබ පිටතට ගිය විටත් ඔබට පිංතූර ලැබෙයි. මේ කෙනා ව්‍යාපාරිකයායි. ඔබට රෙදි මත වුවද පිංතූර මුද්‍රණය කළ හැකි බව බාබා පවසයි. කෙනෙකුට ලොකු මුද්‍රණ යන්ත්‍රයක් නොමැති නම්, ඔබට පිංතූර, කෑලි දෙකක මුද්‍රණය කොට, මූට්ටුව නොපෙනෙන ලෙසට ඒ දෙක එකට යා කළ හැක. අසීමිත පියා, උසස්ම අධිකාරිය පවසන්නේ මෙවැනි දෙයක් යම් කෙනෙක් මුද්‍රණය කරවන්නේ නම්, මම ඔහුගේ නම කීර්තිමත් කරවන්නෙමි. යම් කෙනෙක් මේවා රෙදි වල මුද්‍රණය කොට පිටරට ගෙන යන්නේ නම්, ඔහුට එක පිංතූරයකට රු. 5000 සිට 10,000 දක්වා මුදලක් ලබා ගත හැකි වෙයි. එහි ඔවුන්ට බොහෝ මුදල් තිබේ. මේවා සෑදිය හැක. එහි බොහෝ විශාල මුද්‍රණ යන්ත්‍ර තිබෙන බැවින් ඔවුන් නගර වල ඉතාමත් අලංකාර දර්ශන සහ දර්ශන පට මුද්‍රණය කරනු ලබයි. මේවාද මුද්‍රණය කළ හැක. මෙය නොම්මර එකේ වැඩකි. මෙහි සත්‍ය ඥානය තිබේ යැයි ඔවුන් කියයි. වෙනින් කිසිවෙකුට මෙම ඥානය තිබිය නොහැක. මෙය කිසිවෙකු දන්නේ නැත. විස්තර කරන ඕනෑම කෙනෙක් ඉංග්‍රීසි භාෂාව කතා කිරීමේ දක්ෂ විය යුතුයි. එහි සෑම කෙනෙකුටම ඉංග්‍රීසි භාෂාව වැටහෙයි. ඔවුන්ටද පණිවිඩය දිය යුතුයි. නාටකයට අනුව විනාශයට උපකරණ වන්නේ එම අයයි. දෙපැත්තේම කෙතරම් බෝම්බ තිබේද යත්, ඔවුන් එකතුවන්නේ නම් ඔවුන්ට ලොව අධිපතියන් වීමට හැකි වන්නේය යැයි බාබා ඔබට කියා තිබේ. කෙසේවෙතත්, මෙම නාටකය නිර්මාණය වී ඇත්තේ ඔබ යෝගා බලයෙන් මුළු ලොවෙහිම ආධිපත්‍යය දිනාගන්නා අන්දමින්ය. කිසිවෙකුට ආයුධ වලින් ලොවෙහි අධිපති විය නොහැක. ඔවුන්ට විද්‍යාව ඇති අතර ඔබට නිශ්ශබ්දතාවය තිබේ. පරම පියාව සහ චක්‍රය සිහිපත් කර අන් අයව ඔබට සමාන කරවන්න, එපමණයි. ඔය දරුවන් යෝගා බලයෙන් ලොවෙහි ආධිපත්‍යය හිමි කරගනිමින් සිටියි. ඔවුන් අනිවාර්යෙන්ම ඔවුන් අතරේ සටන් ඇති කර ගනී. ඒ අතරමැද සිට වෙඩරු පිඩ ලබා ගන්නේ ඔබයි.

ඔවුන් ක්‍රිෂ්ණාගේ කටේ වෙඩරු පිඩක් පෙන්වා ඇත. දෙදෙනෙක් සටන් කරද්දී තුන් වැන්නා වෙඩරු පිඩ ගෙන කැවේය යන කියමන ද තිබේ. ඇත්තෙන්ම එය එසේමයි. ඔබ මුළු ලෝක රාජධානියේ වෙඩරු පිඩ ලබා ගනී. එබැවින් ඔබට බොහෝ සතුට තිබිය යුතුයි. ඔහෝ! බාබා එය ඔබගේ ආශ්වර්යයයි! මෙය ඔබගේ ඥානයයි. පැහැදිලි කිරීම ඉතාමත් හොඳයි. ආදි සනාතන දෙවි දේවතා ධර්මයේ අය ලොවෙහි ආධිපත්‍යය ලබා ගත්තේ කෙසේද? කිසිවෙකු මේ පිළිබඳව සිතා නැත. ඒ කාලයේදී වෙනත් රටවල් නොමැත. පරම පියා පවසන්නේ මම ලොවට අධිපති වන්නේ නැත. මම ඔබව එය බවට පත් කරවන්නෙමි. ඔබ ඉගෙන ගැනීමෙන් ලොව අධිපතියන් බවට පත්වෙයි. පරමාත්ම ජීවය වන මම අශාරීරිකයි. ඔබ සෑම කෙනෙකුටම ශරීරයක් තිබේ. ඔබ ශාරීරික ජීවයන්ය. බ්‍රහ්මා, විෂ්ණු සහ ශංකර්ට සූක්ෂම ශරීර තිබේ. ඔබ සෑම කෙනෙක්ම ජීවාත්ම වන සේම මම උත්තරීතර ජීවයයි. මගේ උපත දිව්‍යමයයි, සුවිශේෂයි. වෙනින් කිසිවෙකුට මේ අන්දමින් උපතක් ගැනීමට නුපුළුවන. මෙය නිශ්චිතයි. මේ සෑම දෙයක්ම නාටකයේ නිශ්චය වී තිබේ. කෙනෙක් මිය යන්නේ නම් එයත් නාටකයේ නිශ්චය වී තිබේ. ඔබට නාටකය පිළිබඳව ඉතා හොඳ වැටහීමක් ලැබෙයි. ඔබට වැටහෙන්නේ අංකානුසාරයෙනි. සමහරුන්ට නොපැසුණු බුද්ධීන් තිබේ. ශ්‍රේණීන් තුනක් තිබේ. අවසාන ශ්‍රේණිය ලබා ගන්නා අය නොපැසුණු අය යැයි කියැවේ. පළමුවන ශ්‍රේණියේ සිටින්නේ කවුරුන්ද, දෙවන ශ්‍රේණියේ සිටින්නේ කවුරුන්ද කියා ඔවුන්ටම වැටහෙයි. වැසියන් අතරද එසේමයි. ඉගෙනුම එකමයි. ඉගෙන ගැනීමෙන් පසුව ඔබ ද්විත්ව ඔටුනු පළන් අය බවට පත් වන බව ඔය දරුවන් දන්නවා. අප ද්විත්ව ඔටුනු පළන් අයව සිටියෙමු. ඉන්පසු අප එක් ඔටුන්නක් ඇති අය බවට පත් වූ අතර දැන් අපට ඔටුන්නක් නොමැත. ඔබ කරන ක්‍රියාවන් වලට අනුව ඵල ලබයි යැයි කියැවේ. ස්වර්ණමය යුගයේදී ඔබ මෙසේ කියන්නේ නැත. මෙහිදී ඔබ හොඳ ක්‍රියාවන් සිදු කළොත් එක් උපතකට හොඳ ඵල ලැබෙයි. සමහරුන් කුමන අන්දමේ ක්‍රියාවන් සිදු කරන්නේද යත් ඔවුන් උපතේ සිටම රෝගීන්ය. එයද කර්මයේ දුක් විඳීමය. ඔය දරුවන්ට කර්ම, අකර්ම සහ විකර්ම පිළිබඳ වන කර්ම න්‍යාය විස්තර කර දී තිබේ. ඔබ කරන ඕනෑම දේක, හොඳ හෝ නරක ඵල ලැබෙන්නේ මෙහිදීය. කෙනෙක් ධනවත් වන විට ඔහු අනිවාර්යෙන්ම පෙර කළ, හොඳ ක්‍රියාවන් කරන්නට ඇති. ඔබ දැන් උපතින් උපතට ඔබගේ තිළිණය නිර්මාණය කරගනිමින් සිටියි. එහිදි දුප්පත් සහ ධනවත් අතර වෙනස රඳා පවතින්නේ මෙකළ සෑම කෙනෙක්ම දරන උත්සාහයට අනුකූලවය. එම තිළිණය උපත් 21 කට අවිනාශී වෙයි. මෙහිදී ඔබට තාවකාලිකව පමණක් යම් දෙයක් ලැබෙයි. ඔබ දිගටම ක්‍රියාවන් සිදු කළ යුතුයි. මෙය කර්ම ක්ෂේත්‍රයයි. ස්වර්ණමය යුගය, දිව්‍ය ලෝකයේ කර්ම ක්ෂේත්‍රයයි. එහිදී පාප කර්මයන් සිදු කරන්නේ නැත. මේ සෑම දෙයක්ම බුද්ධිය විසින් ධාරණය කර ගත යුතුයි. මෙම කරුණු සටහන් කර ගන්නේ ඉතා සුළු කිහිප දෙනෙක් පමණයි. සමහරුන් තම වාර්තාව ලිවීමෙන්ද වෙහෙසට පත්වෙයි. ඔය දරුවන් මෙම කරුණු සටහන් කර ගත යුතුයි. මෙම කරුණු බොහෝ ගැඹුරු බැවින් ඔබට මේවා මතක තබා ගැනීමට බැරි වෙයි ඒවා ලිස්සා යයි. එවිට ඔබට කිසියම් කරුණක් අමතක වූවා කියා පසුතැවිලි වීමට සිදුවෙයි. සෑම දෙනාගේම තත්ත්වය එක වගේය. බොහෝ දෙනෙකුට අමතක වී ඉන්පසු පසු දින මතක් වෙයි. ඔය දරුවන් තමන්ගේම දියුණුව ගැන සැලකිළිමත් විය යුතුයි. බාබා දන්නවා ඔබගෙන් ඉතාම ටික දෙනයි නිවැරදිව ලියන්නේ කියා. බාබා ව්‍යාපාරිකයාද වෙයි. මේ කෙනා විනාශ වන මැණික් වෙළෙන්දෙක්ව සිටියේය. අර ව්‍යාපාරිකයා ඥාන මාණික්‍ය ව්‍යාපාරිකයෙකි. බොහෝ දරුවන් යෝගා විෂයෙහි අසමත් වෙයි. ඔබගෙන් බොහෝම ටික දෙනෙකුටයි පැයකට හෝ පැය එක හමාරකට නිවැරදි යෝගාවේ සිටිය හැකි වන්නේ. ඔබ පැය අටක් උත්සාහ දැරිය යුතුයි. ඔය දරුවන්ගේ ජීවිකාව වෙනුවෙන්ද ආදායමක් උපයා ගත යුතුයි. බාබා ඔබට එම ආදරවන්තයා සහ ආදරවන්තිය ගැන නිදසුන දී ඇත. ඔවුන් එකිනෙකා තනිව කොහේ හෝ අසුන් ගෙන සිටින විට, එකිනෙකා සිහිපත් කොට, ඉදිරියේ පෙනී සිටියි. එයද දර්ශනයක් මෙනි. මේ කෙනා ඒ ඒකායන කෙනාව සිහිපත් කරන අතර, එම ඒකායන කෙනා මෙයාව සිහිපත් කරයි. මෙහි ඒ ඒකායන කෙනා ආදරවන්තයා වන අතර ඔබ සියලුම දෙනා ආදරවන්තයින්ය. ඒ ලස්සන ආදරවන්තයා ඉතාමත්ම ලස්සනයි, සදා පාරිශුද්ධයි. පරම පියා පවසන්නේ මම සංචාරකයායි, සදාතනිකවම ලස්සන කෙනායි. මම ඔබවත් ලස්සන කරවන්නෙමි. දේවතාවන්ට ස්වභාවික ලස්සන තිබේ. මෙහි මිනිසුන්ට බොහෝ විලාසිතා තිබේ. ඔවුන් බොහෝ විවිධාකාර ඇඳුම් අඳිති. එහෙ, ඔවුන්ට නිරන්තර සහ ස්වභාවික ලස්සන තිබේ. ඔබ දැන් එම ලෝකයට යමින් සිටියි. පරම පියා පවසන්නේ මම පැරණි, අපවිත්‍ර දේශයකට සහ අපවිත්‍ර ශරීරයකට ඇතුළු වන්නෙමි. මෙහි කිසිකෙනෙකුට පිවිතුරු ශරීරයක් නොමැත. පරම පියා පවසන්නේ මම මෙම කෙනාගේ උපත් රාශියක අවසාන උපතේදී ඔහුගේ ශරීරයට ඇතුළු වී පවුල් මාවත ස්ථාපනය කරන්නෙමි. ඔබ දිගටම දියුණු වත්ම වැඩියෙන් සේවය කිරීමට සුදුස්සන් වෙයි. ඔබ උත්සාහ දරා ඉන්පසු වටහා ගනී. ඔබ එම උත්සාහයන් පෙර ද කළ අතර නැවතත් එසේ කරයි. උත්සාහ නොදරා ඔබට කිසි දෙයක්

ලබා ගත නොහැක. සාමාන්‍ය මනුෂ්‍යයෙකුගෙන් නාරායන් බවට පත්වීමට ඔබ උත්සාහ දරන බව ඔබ දන්නවා. නව ලොවෙහි රාජධානිය පැවතියේය. එය දැන් නොපවතී එය පසුව නැවතත් පවතී. කලි යුගයට පසුව ස්වර්ණමය යුගය අනිවාර්යයෙන්ම පැමිණෙයි. කිසිදු වෙනසක් නොමැතිව, පෙර චක්‍රයේදී කළ ආකාරයටම රාජධානිය නැවතත් ස්ථාපනය කෙරේ. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. තමාගේ කැප වීමත් සමඟම, විශ්වාසයෙන් පිරුණු බුද්ධියක්ද ඔබට තිබිය යුතුයි. කිසිම විටෙක අපවිත්‍ර ක්‍රියාවන් සිදු නොකරන්න. ඔබ තුළ කිසිම දෝෂයක් නොමැති විට පමණයි ඔබට හොඳ තරාතිරමක් ලබා ගත හැකි වන්නේ.
2. ඥාන මිණු මුතු සමඟ හොඳ ව්‍යාපාරයක යෙදෙන්නට නම්, බාබා ඔබට කියන හොඳ කරුණු සටහන් කර ගන්න. ඉන්පසු ඒවා මෙනෙහි කර වෙනත් අයට කියන්න. සෑම විටම තමන්ගේ දියුණුව ගැන සැළකිලිමත් වන්න.

**වරදානය:** ඔබ දරුවෙක් බවට සහ අධිපතියෙක් බවට, සමානව පත් වීමෙන් සියලු සම්පත් වලින් පිරිපුන් වේවා.

දරුවෙක් වීමේ කුල්මත් බව සියලු දෙනාටම තිබෙන ආකාරයෙන්ම, දරුවෙක් සහ අධිපතියෙක් වන්න, එනම්, පියා හා සමාන පරිසමාප්ත මනෝ ස්ථිතිය අත්දකින්න. අධිපතියෙකුගේ විශේෂත්වය වන්නේ, කෙනෙක් කෙතරම් ප්‍රමාණයකට අධිපතියෙක් වන්නේද, එයට අනුව ලෝක සේවාධාරියෙකුගේ සංස්කාර නිරන්තරයෙන් ඉස්මතු වෙයි. ඔබට අධිපතියෙක් වීමේ සහ ලෝක සේවාධාරියෙක් වීමේ කුල්මත් බව එකම ප්‍රමාණයකට තිබෙන විට, එවිට ඔබ පරම පියාට සමාන බව කියැවෙයි. දරුවෙක් සහ අධිපතියෙක් යන ස්වරූප දෙකම නිරතුරුවම ප්‍රායෝගිකව ක්‍රියාවට දමන්න, එවිට, ඔබට පරම පියාට සමාන වීමේ ස්ථිතිය සහ සියලු සම්පත් වලින් පිරිපුන් බව අත්විඳීමට හැකි වෙයි.

**පාඨය:** මෙම දැනුමේ අසීමිත සම්පත් වලට අයිතියක් හිමි කරගන්න, එවිට යැපීම අවසන් වෙයි.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: යෝගා බලයෙන් ඔබගේ මනසින් තමන් මත සහ අන් අය මත පර්යේෂණ සිදු කරන්න.**

වචන තුළින් සේවය කිරීම ස්වභාවික වී ඇති ආකාරයටම, ඔබේ මනසින් සේවය කිරීම එකවිටම සහ ස්වභාවිකව සිදු වේවා. වචන තුළින් සේවය කිරීමත් සමඟම, ඔබේ මනසින් සේවය කිරීම දිගටම කරගෙන යන්න, එවිට ඔබට අඩුවෙන් කතා කිරීමට සිදුවනු ඇත. ඔබ ඔබේ මනසින් සේවය කිරීමෙන් සහයෝගයෙන් කටයුතු කරන විට කතා කිරීමේදී භාවිතා කළ ශක්තිය ඉතිරි වන අතර, එම මනසෙහි බලවත් සේවය ඔබට වැඩි සාර්ථකත්වයක් අත්විඳීමට සලස්වයි.